## Ancient Modulation System

<u>සහස්‍ර ලෝකධාතු වෙත ධර්ම දේශනා කිරීම</u>

නවීන විද්‍යුත්සන්නිවේදන ක්‍රම සඳහා අද භාවිත කෙරෙන මූර්ජන (Modulation) ක්‍රම ගණනාවක් ඇත. මේ අතර පවතින ප්‍රධාන ඒවා නම් විස්ථාර මූර්ජනය (Amplitude Modulation - AM) සහ සංඛ්‍යාත මූර්ජනය (Frequency Modulation - FM) ලෙස දැක්විය හැකිය. මෙහිදී සිදු කෙරෙන්නේ ගුවන් විදුලි තරංගයකට, කටහඬක් හෝ වෙනත් ශබ්දයක් හෝ නිසල රූපයක් හෝ චලන චිත්‍රයක් මුසුකර සන්නිවේදනය කිරීමයි.

මේ සියල්ලටම වඩා දියුණු, නවීන විද්‍යාවෙන් මෙතෙක් සොයා නොගත් මූර්ජන ක්‍රමවේදයක් අපමහ බුදුරජානන් වහන්සේ භාවිත කරනලද බවට ත්‍රිපිටකය සාක්ෂි දරයි.

දිනක් ආනන්ද ස්වාමින් වහන්සේ ඇමතූ ගෞතම බුදුන් වහන්සේ, මීට ඉහත විසූ බුදුන් වහන්සේලා අනන්ත ගණනක් සක්වලයන්හි විසූ මනුෂ්‍යයන්ට ධර්ම දේශනා කර ඇති බව වදාල සේක. ඔබවහන්සේටත් එය කළහැකිදැයි ආනන්ද ස්වාමින් වහන්සේ විමසූ විට, දසදහසක් සහස්‍ර ලෝකධාතු වල වෙසෙන මනුෂ්‍යයන් හට, තමා විසින් ධර්ම දේශනා කරඇති බව බුදුන් වහන්සේ වදාල සේක. එයඅසා විශ්මයට පත් ආනන්ද ස්ථවිරයෝ එය සිදු කරන්නේ කෙලෙසදැයි විමසූවිට, පිළිතුරු දුන් බුදුන් වහන්සේ මෙසේ දේශනා කළසේක.

පළමුව එම ලෝකධාතුව වෙත බුද්ධරශ්මි ධාරාවක් එල්ල කර, ශබ්දයද ඊට මුසුකර ධර්ම දේශනා කරනබව උන් වහන්සේ වදාල සේක. එම බුද්ධ රශ්මි ධාරාව, සාමාන්‍ය ආලෝකයක් නොව, එමෙන් දසදහස් ගුණයක වේගයකින් ගමන්කරන රශ්මි ධාරාවකි.

මෙලෙස ශබ්දය මිශ්‍රකිරීම නවීන විද්‍යාවෙහි හඳුන්වනු ලබන්නේ මූර්ජනය හෙවත් Modulation යනුවෙනි.